සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ


➢ ශ්‍රේණිය - 7
➢ විෂයය - ඉතිහාසය
➢ පාඩම - 04 - පසුකාලීන පාලන මධ්‍යස්ථාන (1 කොටස )

❑ සැකසුම - තමාලි පෙරේරා
නියෝජ්‍ය විදුහල්පති
මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය

# පසුකාලීන පාලන මධ්‍යස්ථාන

## 7 ශ්‍රේණිය

4 පාඩම



# රජරට ශිෂ්ටාචාරය

**අනුරාධපුරය රාජධානිය + පොළොන්නරු රාජධානිය**

වසර 1500

වසර 150

# පොළොන්නරු රාජධානිය පරිහානියට පත්වීම

- දුර්වල පාලකයන් බලයට පත් වීම
- විදේශ ආක්‍රමණ




➤ ක්‍රි.ව. 1215 කාලිංග මාඝගේ ආක්‍රමණය


➤ කාලිංග මාඝ එවකට පොළොන්නරුවේ පාලකයාව සිටි **පරාක්‍රම පාණ්ඩ්‍ය** පරාජය කොට රජරට බලය අල්ලා ගත්තේය

## ❖ ආරක්ෂිත බලකොටු පිහිටවූ ප්‍රාදේශීය පාලකයෝ

- සංඛ සෙනෙවි - මිනිපේ ගංදෙණිය
- සුභ සෙනෙවි - යාපහුව
- බුවනෙකබාහු ආදිපාදතුමා - ගෝවින්ද මලය



- මොවුන්ගේ ක්‍රියාවලිය නිසා දකුණට ආක්‍රමණිකයන් පැමිණීම වැළකුණි



සුචිය
රාජධානි කේන්ද්‍ර කරගත් නගර
බලකොටු පිහිටුවාගත් ස්ථාන
පරිපාලන බෙදීම්
රජරට
මායාරට
මලයරට
රුහුණුරට
අනුරාධපුරය
පොළොන්නරුව
යාපහුව බලකොටුව
මිණිපේ ගංදෙණිය බලකොටුව
ගෝවින්දමලය බලකොටුව
10 0 10 20 30 කි.මී

- ඉහත ප්‍රාදේශීය පාලකයන්ට ශක්තිමත් රාජධානියක් බිහි කිරීමට හැකියාවක් නොතිබුණි

- වන්නි නායකයෙකු වූ **තුන්වන විජයබාහු රජතුමා** එම අභියෝගය ජය ගත්තේය

- එතුමා දඹදෙණි රාජධානිය පිහිටුවීය



## ❖ පසුකාලීන පාලන මධ්‍යස්ථාන

- දඹදෙණිය
- යාපහුව
- කුරුණෑගල
- ගම්පොළ
- කෝට්ටේ

වසර 200

දඹදෙණි යන්න කුඩේ ගනින් කෝ



# වරින් වර රාජධානි බිහි වීමට හේතු

- ආරක්ෂක හේතු
  - රාජ්‍ය උරුමකරුවන් අතර පැවති ගැටුම්
  - විදේශීය ආක්‍රමණ

- ආර්ථික හේතු
  - කුළුබඩු බහුලව වැවුණු තෙත් කලාපය ආර්ථික කටයුතුවලට වඩාත් හිතකර වීම
  - රජරට වාරිමාර්ග පද්ධතිය බිඳ වැටීම



# දඹදෙණි රාජධානිය








# 1. තුන්වන විජයබාහු රජතුමා ක්‍රි.ව. 1232 - 1236



- රජවීමට පෙර ප්‍රාදේශීය පාලකයෙක් විය
- දඹදෙණිය අගනුවර කරගෙන රාජ්‍යත්වයට පත්විය
- මායා රට එක්සත් කළේය
- කොත්මලේ ප්‍රදේශයේ සඟවා තිබූ දළදා වහන්සේ දඹදෙණියට වැඩමවා බෙලිගල කඳු මුදුනේ දළදා මන්දිරයක තැන්පත් කළේය

මායා රට


SRI LANKA
202 BC
PIHITI RATA
Anuradhapura
MAYA RATA
Kelaniya
RUHUNA
Tissamasharama
Eschatia

# 2. දෙවන පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව. 1236 - 1270

- මෙතුමා තුන්වන විජයබාහු රජුගේ වැඩිමල් පුත්‍රයාය.
- දඹදෙණියේ බලයට පත් වැදගත්ම පාලකයා ලෙස සැලකේ

➢ මෙතුමා මුහුණ දුන් අභියෝග

- කාලිංග මාඝ පලවා හැරීම
- චන්ද්‍රභානු රජුගේ පළමු වන ආක්‍රමණය පරාජය කිරීම
- චන්ද්‍රභානු රජුගේ දෙවන ආක්‍රමණය පරාජය කිරීම



# 1.කාලිංග මාඝ පරාජය කිරීම

- ක්‍රි.ව. 1215 සිට වසර හතළිහක් පමණ කාලයක් මාඝ මෙරට රැඳී සිටියේය
- මාඝගේ හමුදා පරාජයට පත් කිරිමට දෙවන පරාක්‍රමබාහු රජුට විශාල සටනක් කිරීමට සිදුවිය
- අවසානයේ පොළොන්නරු නගරය වටලා රජු එල්ල කළ ප්‍රහාරයකින් මාඝගේ හමුදාව පරාජයට පත්විය




## 2.චන්ද්‍රබානුගේ ආක්‍රමණ

- චන්ද්‍රභානු අග්නිදිග ආසියාවේ මලය අර්ධද්වීපයේ සිට ලංකාවට පැමිණි ආක්‍රමණිකයෙකි
- ඔහු දෙවරක් ලංකාව ආක්‍රමණය කළේය
- එම අවස්ථා දෙකේදීම චන්ද්‍රබානු පරාජය කිරීමට දෙවන පරාක්‍රමබාහු රජු සමත් විය




## ❖ දෙවන පරාක්‍රමබාහු රජුගේ සාහිත්‍ය සේවාව

- රජතුමා සිංහල පාලි සංස්කෘත වැනි භාෂා හැදෑරූ විශිෂ්ට උගතෙකි
- මේ නිසා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබීය
- කව්සිළුමිණ එතුමා රචනා කළ කෘතියකි



## ❖ දෙවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන්

- පිය රජතුමා බෙලිගල තැන්පත් කර තිබූ දළදාව  දඹදෙණියට වැඩම කරවීම
- දඹදෙණියේ නව දළදා මැදුරක් තැනවීම
- දේවපතිරාජ ඇමතිවරයා  ලවා රටේ සංවර්ධන කටයුතු සිදු කරවීම
- ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය වැඩිදියුණු කරවීම
- උයන් තැනවීම ,පාලම් සෑදවීම හා
  පොල් වැනි බෝග වගා කරවීම ආදී
  සංවර්ධන කටයුතු කරවීම



# 3. හතරවන විජයබාහු රජතුමා

- මෙතුමා දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ වැඩිමල් පුත්‍රයාය
- වසර දෙකක් රජකම් කළේය
- රජවාසලේ ඇති ඇතිවූ කුමන්ත්‍රණයකින් මිය ගියේය



# 4. පළමුවන බුවනෙකබාහු රජතුමා

- මෙතුමා හතරවන විජයබාහු රජුගේ සොහොයුරාය
- ටික කලෙකින් වඩාත් ආරක්ෂිත ස්ථානයක් වූ යාපහුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්තේය



# යාපහුව රාජධානිය








# 1.පළමුවන බුවනෙකබාහු රජතුමා

## ➢ මෙතුමාගේ සේවාවන්



- යාපහුවේ දළදා මැදුරක් ඉදිකිරීම
- බෞද්ධ පොත්පත් රචනා කරවීම
- මිසරය (ඊජිප්තුව) සමග වෙළඳ සබඳතා පැවැත්වීම

- මේ සඳහා රජතුමා මිසරයේ කයිරෝ නගරයට දූත පිරිසක් යවා තිබේ

# කුරුණෑගල රාජධානිය







# 1.දෙවන බුවනෙකබාහු රජතුමා

- මෙතුමා පළමුවන බුවනෙකබාහු රජුගේ පුත්‍රයාය
- කුරුණෑගල ආරම්භක පාලකයා විය



## 2.හතරවන පරාක්‍රමබාහු රජතුමා

- මෙතුමා දෙවන බුවනෙකබාහු රජුගේ පුත්‍රයාය
- කුරුණෑගල යුගයේ වැදගත්ම පාලකයාය
- උගතෙක් වූ රජතුමා ග්‍රන්ථකරණය සඳහා අනුග්‍රහ දැක්වීය



➢ මෙම රජුගේ අනුග්‍රහයෙන් ,

- පාලි භාෂාවෙන් ලියා තිබූ පන්සිය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කරන ලදී

➢ උගතුන් විසින්

❖ දළදා සිරිත,
❖ සිංහල බෝධි වංශය,
❖ අනාගත වංශය

වැනි සාහිත්‍ය කෘති රචනා කරන ලදී



## ❑ ක්‍රියාකාරකම

1. රජරට ශිෂ්ටාචාරයට අයත් වන රාජධානි දෙක නම් කරන්න
2. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ප්‍රධාන ආක්‍රමණය කුමක්ද ?
3. එම ආක්‍රමණය අවස්ථාවේ පොළොන්නරුවේ සිටි පාලකයා නම් කරන්න
4. මෙකල වැදගත් වූ ආරක්ෂිත ස්ථාන තුනක් නම් කර එම ස්ථානවල බලකොටු තැනූ ප්‍රාදේශීය නායකයන් නම් කරන්න
5. පොළොන්නරුවෙන් පසු බිහිවූ පාලන මධ්‍යස්ථාන 5 පිළිවෙලින් නම් කරන්න
6. මෙකල වරින් වර රාජධානි බිහිවීමට බලපෑ ආරක්ෂක හා ආර්ථික හේතු දෙක බැගින් නම් කරන්න
7. දඹදෙණි රාජධානියේ ආරම්භක පාලකයා නම් කරන්න
8. එතුමාගේ වැදගත් කාර්යයන් දෙකක් ලියන්න
9. දඹදෙණියේ වැදගත්ම පාලකයා කවුරුන්ද ?
10. එතුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග නම් කරන්න
11. එතුමාගේ වැදගත් කාර්යයන් දෙකක් ලියන්න
12. එතුමා හැඳින්වූ උපාධිනාමය හා එතුමා රචනා කළ කෘතියක් නම් කරන්න
13. යාපහුව රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන්ද ?
14. එතුමා වෙළෙඳ සබඳතා ගොඩනඟා ගත් රාජ්‍යය නම් කරන්න
15. කුරුණෑගල රාජධානියේ ආරම්භක පාලකයා නම් කරන්න
16. කුරුණෑගල යුගයේ වැදගත්ම පාලකයා කවුරුන්ද ?
17. කුරුණෑගල යුගයේ රචනා වූ ග්‍රන්ථ නම් කරන්න

ස්තුතියි!

තමාලි පෙරේරා